# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1992 අංක 1 දරන
## ශ්‍රී ලංකා දියවැඩියා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1992 පෙබරවාරි මස 19 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1992 පෙබරවාරි මස 21 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : ශත 60 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1992 අංක 1 දරන ශ්‍රී ලංකා දියවැඩියා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1992 පෙබරවාරි මස 19 වන දින]

එල්. ඩී.—ඕ. 111/90

**ශ්‍රී ලංකා දියවැඩියා සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"ශ්‍රී ලංකා දියවැඩියා සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන හා හඳුන්වනු ලබන සංගමයක් එහි සාමාජිකයන් එකඟ වූ රීති අනුව එහි සියලු පරමාර්ථ හා කටයුතු ඵලදායි ලෙස ක්‍රියාවේ යෙදීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබුණු හෙයින් ද : **පූර්විකාව.**

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කටයුතු සඳහා ද එම පරමාර්ථ හා කටයුතු එකී සංගමය විසින් මෙතෙක් කල් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටුකරගෙන ගොස් ඇති හෙයින් ද, ඒ සංගමය සංස්ථාගත කරන මෙන් ඉල්ලා ඇති හෙයින් ද ඒ ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**ලුහුඬු නාමය.** 1. මේ පනත 1992 අංක 1 දරන ශ්‍රී ලංකා දියවැඩියා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**ශ්‍රී ලංකා දියවැඩියා සංගමය සංස්ථාගත කිරීම.** 2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට හා ඉන් පසුව, (මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා දියවැඩියා සංගමයේ දැනට සාමාජිකයන් වන තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් ඇතුළත් කර ගනු ලබන සියලු තැනැත්තන් "ශ්‍රී ලංකා දියවැඩියා සංගමය" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් වන අතර, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද ඊට විරුද්ධව ද සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි ය. තවද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

**සංස්ථාවේ පොදු පරමාර්ථ.** 3. සංස්ථාව මෙයින් සංස්ථාපනය කරනු ලබන්නේ පහත දැක්වෙන පොදු පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) මධුමේහය හා තදාශ්‍රිත රෝග පිළිබඳ හේතු හා ප්‍රතිකර්ම සම්බන්ධයෙන් අධ්‍යයන කටයුතු වැඩිදියුණු කිරීම ;

(ආ) මධුමේහය හා තදාශ්‍රිත රෝග සම්බන්ධයෙන් දැනීම ප්‍රචලිත කිරීමට සහාය වීම ;

(ඇ) මධුමේහය හා තදාශ්‍රිත රෝග පිළිබඳ පර්යේෂණ සඳහා දිරි ගැන්වීම හා ඒවාට ආධාර කිරීම ;

(ඇ) රැස්වීම්, සම්මන්ත්‍රණ හා සාකච්ඡා සම්මේලන පැවැත්වීම සහ ඉහත කී පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය වන වෙනත් ක්‍රියා මාර්ග හෝ පියවර ගැනීම ;

(ඉ) ඉහත සඳහන් පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම සඳහා හිතකර යයි සංගමය විසින් අදහස් කරනු ලබන සඟරා, පොත් පත්‍රිකා හෝ වෙනත් එවැනි ප්‍රකාශන මුද්‍රණය කිරීම, ප්‍රසිද්ධ කිරීම සහ බෙදාහැරීම ;

(ඊ) පහත දක්වා ඇති පහසුකම් කෙළින්ම හෝ යම් තැනැත්තකු, සංස්ථාවක් හෝ ආයතනයක් සමග කටයුතු පිළියෙළ කිරීමෙන් සැපයීම, ඒවාට ආධාර කිරීම, පරිත්‍යාග කිරීම, සැලසීම හෝ කළමනාකරණය කිරීම :—

(i) වෛද්‍ය, ශල්‍ය වෛද්‍ය සහ රෝගෝපසමන නිවාස ;

(ii) දියවැඩියා ක්ෂේත්‍රයෙහි ලා පර්යේෂණාගාර, පර්යේෂණ ආයතන සහ චිකිත්සාගාර, පාසල් අධ්‍යාපන පහසුකම් කඳවුරු ;

(iii) දියවැඩියා රෝගය පිළිබඳ අධ්‍යයන කිරීම සඳහා ශිෂ්‍යත්ව ;

(iv) දියවැඩියා රෝගීන්ගේ යහපත සඳහා වූ ව්‍යාපෘතිවල නියුක්ත වෛද්‍යවරුන්ට, ශිෂ්‍යයන්ට, හෙදියන්ට සහ වෙනත් යම් ආයතනවලට, සංගමය විසින් කරනු ලබන නියමයන් සහ කොන්දේසි යටතේ, අධ්‍යාපන හා පුහුණුවීමේ පහසුකම් ;

(උ) දියවැඩියා රෝගීන් සඳහා වෛද්‍ය සේවා හෝ පහසුකම් සැපයීමෙහි ලා මහනගර සභා, රජයේ හෝ පළාත් සභා, සෞඛ්‍ය ආයතන සමග සහයෝගයෙන් කටයුතු කිරීම ;

(ඌ) සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති ශ්‍රී ලාංකික හෝ විදේශීය වෙනත් ආයතන සමග සම්බන්ධතා පැවැත්වීම ; සහ

(එ) ඉහත සඳහන් පරමාර්ථ ඉෂ්ට කර ගැනීම සඳහා ආනුෂංගික හෝ හිතකර වන වෙනත් සියලුදේ කිරීම වේ.

**සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.**

4. (1) සංස්ථාවේ කටයුතු සංස්ථාවේ තත්කාලයේ වලංගුව බල පවත්වන රීති වලින් ඉඩ සලස්වා ඇත්තා වූ ද, ඒ රීතිවලට අනුකූලව තෝරා පත්කර ගනු ලබන්නා වූ ද තැනැත්තන් සංඛ්‍යාවකින් සමන්විත වූ කමිටුවක් විසින් එකී රීතිවලට යටත්ව පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම කමිටුව, මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේදී ධුරදැරූ සංගමයේ කමිටුව විය යුතු ය.

**සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.**

**5.** මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නියෝදනයක් ප්‍රකාර හෝ අන් ආකාරයකින් සංස්ථාව සතු වන යම් චංචල හෝ නිශ්චල දේපළක් භාර ගැනීමට සහ දැරීමට සංස්ථාවට නීතියෙන් බලය ඇති අතර, ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සහිතව, සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීති වලට යටත්ව, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

**සංගමය විසින් හෝ සංගමයට ගෙවිය යුතු ණය.**

**6.** මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුවම වූ දිනයේදී සංගමයේ පැවති සියලු ණය හා බැරකම් සංස්ථාව විසින් ගෙවිය යුතු හා පියවිය යුතු වන අතර, එදිනට සංගමයට අය විය යුතු ණය හෝ ගෙවිය යුතු දායක මුදල් හා සම්මාදම් සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

**සංස්ථාවේ රීති.**

**7.** (1) සංස්ථාවට සාමාජිකයන් ඇතුළත් කිරීම, ඔවුන්ගේ සාමාජිකත්වය අත්හිටුවීම හෝ ඔවුන් අස්කිරීම සම්බන්ධයෙන් ද සංස්ථාවේ නිලධරයන්ගේ කාර්ය සම්බන්ධයෙන් ද සංස්ථාවේ කටයුතු කිරීමේදී අනුගමනය කළයුතු කාර්ය පරිපාටිය සම්බන්ධයෙන් සහ සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු පරිපාලනය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සම්බන්ධයෙන් ද සංස්ථාව විසින් කලින් කල දින විසි අටකට නොඅඩු දැනුම් දීමක් අනුව කැඳවනු ලැබූ සාමාජිකයන්ගේ මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන් මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සාදනු ලැබිය හැකි ය.

(2) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී වූ සංගමයේ රීති, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට, මේ වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීති වශයෙන් සලකනු ලැබිය යුතු ය.

(3) සංස්ථාවේ කවර වූ හෝ රීතියක්, (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන රීතියක් පරිද්දෙන්ම සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම හෝ කළ යුතු ය.

(4) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

**විසුරුවා හැරීමෙන් පසු ඉතිරි වන දේපළ.**

**8.** සංස්ථාව විසුරුවා හරිනු ලැබූ විට එහි සියලුම ණය සහ බැරකම් ගෙවා පියවීමෙන් පසු, කවර හෝ දේපළක් ඉතිරි වේ නම්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා නොදිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදාදීම ස්වකීය රීති මගින් තහනම් කර ඇත්තා වූ ද වෙනත් සංගමයකට හෝ සංගම්වලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. ඒ සංගමය හෝ සංගම් කවරේදැයි සංස්ථාව විසුරුවා හරින වේලාවේ දී හෝ ඊට පෙරතුවම හෝ සංස්ථාවේ සාමාජිකයන් විසින් තීරණය යුතු ය.

**ප්‍රතිපූරණය කිරීම.**

9. සංස්ථාවේ යම් සාමාජිකයකු, නිලධරයකු, නියෝජිතයකු හෝ සේවකයකු විසින් සංස්ථාව වෙනුවෙන් සහ සංස්ථාවේ ප්‍රතිලාභය සඳහා සද්භාවයෙන් දරනු ලැබූ යම් වියදමක ප්‍රමාණයට මුදලක් ඒ සාමාජිකයාට, නිලධරයාට, නියෝජිතයාට හෝ සේවකයාට සංස්ථාව විසින් ප්‍රතිපූරණය කළ යුතු ය.

**සංස්ථාවේ මුද්‍රාව.**

10. කමිටුවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර ඒ දෙදෙනා තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් ඒ සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. ඒ අත්සන් කිරීම යම් තැනැත්තකු සාක්ෂිකරුවකු වශයෙන් කළ අත්සන් කිරීමකට පරිබාහිර විය යුතු ය.

**ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.**

11. මේ පනතේ සඳහන් තැනැත්තන් සහ ඔවුන් වෙතින් ඔවුන් මාර්ගයෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන වෙනත් තැනැත්තන් හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම් වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

**අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.**

12. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය කළ හැකි ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 යි. විදේශීය රු. 1,160 යි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.